# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

**අංක 2446/32 – 2025 ජූලි මස 21 වැනි සඳුදා – 2025.07.21**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/04/2023/12.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය අවලංගු කිරීම

1957 අංක 14 සහ 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ විධිවිධාන) පනත සමග කියවෙන) පනත් වලින් සංශෝධිත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2024.03.21 වන දින අංක 2376/28 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2024.03.13 වැනි දින දරන නියෝගයෙන්,

ඒ. එම්. එස්. එම්.පී.එස්.අත්තනායක මහතා, නිවාස අංක 05, නිල නිවාස සංකීර්ණය, සී/ස ලංකා සීනි සමාගම, යාලබෝව, වැල්ලවාය.

සහ

සී/ස ලංකා සීනි (පෞද්ගලික) සමාගම, පෞද්ගලික තැපැල් මල්ල, බුත්තල.

අතර පවත්නා 2024.02.28 දින දරන කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ සඳහන් කරන ලද කාරණය/කරුණු පිළිබඳව වූ කාර්මික ආරාවුල් බේරුම් කිරීමෙන් සමථයට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් පී. එච්. ආනන්ද මහතා වෙත යොමු කරන ලදී.

බේරුම්කරු පී. එච්. ආනන්ද මහතා බේරුම්කරණ ධූරයෙන් ඉල්ලා අස්වන බව දන්වා ඇත. එබැවින් යථෝක්ත නියෝගය අවලංගු කළ යුතු යැයි දැන් පෙනී යන හෙයින් කම්කරු අමාත්‍ය ආචාර්ය අනිල් ජයන්ත ප්‍රනාන්දු වන මා එම නියෝගය අවලංගු කරන අතර එකී 2024.03.13 දින දරන නියෝගය මත ක්‍රියා නොකරන ලෙසද මෙයින් නියෝග කරමි.

**ආචාර්ය අනිල් ජයන්ත ප්‍රනාන්දු,**
කම්කරු අමාත්‍ය.

2025 ජූලි මස 03 දින.
කොළඹ දීය.

EOG 07 - 253/1


1A – G 044912 – 19 (2025/07)

*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

මගේ අංකය: IR/COM/04/2023/12.

ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව,

ඒ.එම්.එස්.එම්.පී.එස්.අත්තනායක මහතා, නිවාස අංක 05, නිල නිවාස සංකීර්ණය, සී/ස ලංකා සීනි සමාගම, යාලබෝව, වැල්ලවාය.

සහ

සී/ස ලංකා සීනි (පෞද්ගලික) සමාගම, පෞද්ගලික තැපැල් මල්ල, බුත්තල.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු අමාත්‍ය ආචාර්ය අනිල් ජයන්ත ප්‍රනාන්දු වන මම, 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් පිළියන්දල, බුද්ධාලෝක පාර, අංක 40, ආචාර්ය කේ.ඒ.තිලකරත්න මහතා පත් කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**ආචාර්ය අනිල් ජයන්ත ප්‍රනාන්දු,**
කම්කරු අමාත්‍ය.

2025 ජූලි මස 03 දින,
කොළඹ දීය.

මගේ අංකය: IR/COM/04/2023/12.

ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනත

(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)

ඒ. එම්. එස්.එම්.පී.එස්.අත්තනායක මහතා, නිවාස අංක 05, නිල නිවාස සංකීර්ණය, සී/ස ලංකා සීනි සමාගම, යාලබෝව, වැල්ලවාය.

සහ

සී/ස ලංකා සීනි (පෞද්ගලික) සමාගම, පෞද්ගලික තැපැල් මල්ල, බුත්තල.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණු වනුයේ,

“ සී/ස ලංකා සීනි (පෞද්ගලික) සමාගමෙහි සේවය කරන ඒ. එම්. එස්. එම්. පී. එස්.අත්තනායක මහතා 2021.03.05 දින වැඩ තහනම් කර පසුව 2022.05.03 වන දින නැවත සේවයෙහි පිහිටුවීමේ දී,

i. වැඩ මූලික තනතුර ජොෂ්ඨ විදුලි කාර්මික ලෙස පහත හෙලීම.
ii. 2022/2023/2024 වැටුප් වර්ධක විලම්භනය කිරීම.
iii. වැඩ තහනමට ලක් වූ කාලය සඳහා වැටුප් නොගෙවීම.
iv. අභ්‍යන්තර ස්ථාන මාරුවක් සිදු කිරීම.
V. ආයතනය විසින් පවත්වනු ලැබූ විධිමත් විනය පරීක්ෂණයේ අවසන් වාර්තාවේ පිටපතක් ලබා නොදීම.

යන කරුණු මගින් අසාධාරණයක් සිදුව තිබේ ද, යන්නත් එසේ අසාධාරණයක් සිදුව තිබේ නම් ඔහුට හිමිවිය යුතු සහනයන් කවරේ ද කවර දා සිට ද යන්නත් පිළිබඳව වේ. ’’

**එච්. එම්. ඩී. එන්. කේ. වටලියද්ද,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2025 ජූනි මස 18 දින,
කොළඹ කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ
කාර්යාලයේදී දින යොදන ලදී.

EOG 07 - 253/2

---

මගේ අංකය: IR/COM/04/2022/36.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය අවලංගු කිරීම

1957 අංක 14 සහ 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ විධිවිධාන) පනත සමග කියවෙන) පනත්වලින් සංශෝධිත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2024.08.10 වන දින අංක 2396/61 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2024.08.02 වැනි දින දරන නියෝගයෙන්,

*එක් පාර්ශ්වයක් වශයෙන්*

එල්.ඩී.පී.දිල්රුප්ෂි මිය ඇතුළු නිලධාරින් 05 දෙනා, කලුහබරල ජනපදය, ඇටඹෙ, නාරංගොඩ.

*අනෙක් පාර්ශ්වය වශයෙන්*

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, අංක 200, කිරුළ පාර, කොළඹ 05.

අතර පවත්නා 2024.07.03 දින දරන කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ සඳහන් කරන ලද කාරණය/කරුණු පිලිබඳව වූ කාර්මික ආරාවුල් බේරුම් කිරීමෙන් සමථයට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් නීතිඥ ඩී. ජී. කේ. කරුණාරත්න මහතා වෙත යොමු කරන ලදි.

බේරුම්කරු නීතිඥ ඩී.ජී.කේ.කරුණාරත්න මහතා බේරුම්කරණ ධුරයෙන් ඉල්ලා අස්වන බව දන්වා ඇත. එබැවින් යථෝක්ත නියෝගය අවලංගු කළ යුතු යැයි දැන් පෙනී යන හෙයින් කම්කරු අමාත්‍ය ආචාර්ය අනිල් ජයන්ත ප්‍රනාන්දු වන මා එම නියෝගය අවලංගු කරන අතර එකී 2024.08.02 දින දරන නියෝගය මත ක්‍රියා නොකරන ලෙසද මෙයින් නියෝග කරමි.

**ආචාර්ය අනිල් ජයන්ත ප්‍රනාන්දු,**
කම්කරු අමාත්‍ය.

2025 ජූලි මස 03 දින.
කොළඹ දීය.

EOG 07 - 254/1

මගේ අංකය: IR/COM/04/2022/36.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව,

***එක් පාර්ශ්වයක් වශයෙන්***

එල්.ඩී.පී.දිල්රුප්ෂි මිය ඇතුළු නිලධාරීන් 05 දෙනා, කලු හබරල ජනපදය, ඇටඹේ, නාරංගොඩ.

සහ

***අනෙක් පාර්ශ්වය වශයෙන්,***

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, අංක 200, කිරුළ පාර, කොළඹ 05.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින්ද,

කම්කරු අමාත්‍ය ආචාර්ය අනිල් ජයන්ත ප්‍රනාන්දු වන මම, 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්,

කිරිබත්ගොඩ, දළුගම, අලුත් හුණුපිටිය පාර, අංක 331/3, නීතිඥ බණ්ඩාර සෙනරත් මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**ආචාර්ය අනිල් ජයන්ත ප්‍රනාන්දු,**
කම්කරු අමාත්‍ය.

2025 ජූලි මස 03 දින.
කොළඹ දීය.

මගේ අංකය: IR/COM/04/2022/36.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**

**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

එල්.ඩී.පී. දිල්රුප්ෂි මිය ඇතුළු නිලධාරීන් 05 දෙනා, කලු හබරල ජනපදය, ඇටඹේ, නාරංගොඩ.

සහ

අනෙක් පාර්ශවය වශයෙන්,
ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, අංක 200, කිරුළ පාර, කොළඹ 05,

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණු වනුයේ,

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ නීති නිලධාරීන් ලෙස නීති අංශයේ දැනට සේවය කරන එල්.ඩී.පී. දිල්රුප්ෂි මිය, පී.ඒ.ඩී.ඩී.පනංගල මිය, ශානිකා දිලන්ති ගාල්ලගේ මිය, නදීශා ගයත්‍රී සිල්වා අමරතුංග මිය හා දැනට සේවයේ නොමැති පී.එස්.එම්.කේ.රත්නායක මිය යන

නිලධාරීන් පස් දෙනා හට,

- ආයතනය තුළ උසස්වීම් හිමි ද, හිමිනම් එය ලබා නොදීම
- රාජකාරී කටයුතු සඳහා නිල වාහන හිමි ද, හිමි නම් එය ලබා නොදීම
- වසර 11 ක් ලබා දී ඇති රු. 15,000 ක වෘත්තීය දීමනාව අත්හිටුවීම
- නව සේවක සංයුතිය හා වැටුප් සංශෝධනය තුළින් තබා ඇති වැටුප් තලය

මගින් අසාධාරණයක් සිදුව තිබේ ද, යන්නත් එසේ අසාධාරණයක් සිදුව තිබේ නම් හිමිවිය යුතු සහනයන් කවරේ ද යන්නත් පිළිබඳව වේ,

**එච්. එම්. ඩී. එන්. කේ. වටලියද්ද,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2025 ජූනි මස 18 දින,
කොළඹ කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ
කාර්යාලයේදී දින යොදන ලදී.

EOG 07 - 0254/2

---

මගේ අංකය: IR/COM/03/2020/271 (1).

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව,

පී.ඩී.ර්.පෙරේරා මිය, අංක. 74/5/4, ඕරුවල, අතුරුගිරිය.

සහ

ජාතික නිවාස සංවර්ධන අධිකාරිය, අංක 34, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ. ගාඩිනර් මාවත, කොළඹ 02.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු අමාත්‍ය ආචාර්ය අනිල් ජයන්ත ප්‍රනාන්දු වන මම, 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් මාතලේ, මැක්ඩොවල් බලකොටුව මාවත, පළමු පටුමග, 34/64, ඒ.බී.හේරත් මහතා. පත් කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**ආචාර්ය අනිල් ජයන්ත ප්‍රනාන්දු,**
කම්කරු අමාත්‍ය.

2025 ජූලි මස 03 දින.
කොළඹ දීය.

මගේ අංකය: IR/COM/03/2020/271 (1).

## ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනත

## (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)

පී.ඩී.ඊ. පෙරේරා මිය, අංක 74/5/4, ඔරුවල, අතුරුගිරිය.

සහ

ජාතික නිවාස සංවර්ධන අධිකාරිය, අංක 34, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ. ගාඩිනර් මාවත, කොළඹ 02.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණු වනුයේ,

“ ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ සේවය කරනු ලබන පී.ඩී. ඊ. පෙරේරා මියට කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 30 හි විධිවිධාන ප්‍රකාරව ප්‍රතිව්‍යුහගත කිරිමේදී ඇයට තනතුරු නාමය පමණක් ලබා දී අදාළ දීමනා කිසිවක් ලබා නොදීමෙන් අසාධාරණයක් සිදුව ඇත් ද යන්නත් එසේ අසාධාරණයක් සිදුව ඇත්නම් ඇයට හිමිවිය යුතු සහන කවරේ ද යන්නත් පිළිබඳව වේ”.

**එච්. එම්. ඩී. එන්. කේ. වටලියද්ද,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2025 ජූනි මස 18 දින,
කොළඹ කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ
කාර්යාලයේදී දින යොදන ලදී.

EOG 07 - 0255